# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 14,514 — 1965 සැප්තැම්බර් 25 වැනි සෙනසුරාද — 1965.9.25**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)**

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

**1965 අංක 365**

අ. ආ. කා. අංක ඕ. 49 (3).

අග්‍රාණ්ඩුකාරතුමන් විසින් 1965 ඔක්තෝබර් 1 වැනි දින සිට සිය පෞද්ගලික කාර්ය මණ්ඩලයට පහත සඳහන් පත්වීම් කර තිබේ :—

අතිරේක අධිසහයකවරුන් වශයෙන්

1. බ්‍රිගේඩියර් සී. පී. ජයවර්ධන මහතා, සී.ඇම්.ජී., සී.වී.ඕ., ඕ.බී.ඊ., ඊ.ඩී., ඒ.ඩී.සී.
2. කර්නල් ස්ටැන්ලි ප්‍රනාන්දු මහතා, ඕ.බී.ඊ., ඊ.ඩී.
3. විං කොමාන්ඩර් පී. ජී. වල්පිට මහතා, රා.ලං.ගු.හ.
4. කොමාන්ඩර් ඩබ්ලිව්. මොලේගොඩ මහතා, රා. ලං. ස්වේ. නා. බ.
5. ලුතිනන් කොමාන්ඩර් ඩී. බී. ගුණසේකර මහතා, රා. ලං. නා. හ.
6. මේජර් ජේ. එම්. කුමාරස්වාමි මහතා, ලං. යු. හ. වෛ. බ.
7. මේජර් එච්. වී. අතුකෝරාල මහතා, ලං. පා. හ. (නි)
8. මේජර් එම්. මඩවල මහතා, ලං. පා. හ. (නි)
9. ලුතිනන් කොමාන්ඩර් එල්. වී. බිල්තාසර් මහතා, රා. ලං. නා. හ.
10. මේජර් එස්. අමරසූරිය මහතා, 1 (ස්වේ) ගැ. රෙ.
11. කපිතන් වයි. ආර්. ඇම්. පී. විජේකෝන් මහතා, ලං. කා. හ.
12. කපිතන් එස්. මුසාෆර් මහතා, ලං. යු. හ. සේ. බ.
13. බලපංති ලුතිනන් ජී. එම්. යූ. ද සිල්වා මහතා, රා. ලං. ගු. හ.
14. කපිතන් ඒ. ඊ. ආර්. අබේසිංහ මහතා, 2 (ස්වේ) ලං. පා. හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නී. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලය,
කොළඹ, 1965 සැප්තැම්බර 23.

9—1148

1403——ආර් 8877—7,650 (65/9)

# මිල පාලන දැන්වීම්

අංක් ඇම්ඇල්/1965/4 දරණ ආහාර මිළ ආඥාව

අතිරේක ආහාර ද්‍රව්‍ය

## මිල පාලන පනත

### ආඥාව

(173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 3 (2) වන වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මාතලේ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිළ පාලක ඩැන්පත් වික්ටර් චන්ද්‍රතිලක බන්ඩාර උනන්තැන්න වන මම, මේ ආඥාවෙන්—

(1) 1965 අප්‍රේල් මස 17 දින අංක 14,378 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ වූ 1965 අප්‍රේල් මස 9 වන දින අංක ඇම්ඇල් 1965/1 දරණ ආහාර මිල ආඥාව, වහාම බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි.

(2) මෙහි වූ උපලේඛනයේ 3 වන තීරුයෙහි දක්වෙන මුදල එකතු කරණ ලද (173 වන අධිකාරය වන) මිල පාලන පනත යටතේ කොළඹ මහ නගර සභා ප්‍රදේශය තුළ තොග වෙළෙන්දෙකු විසින් විකිණිය හැකි උපරිම තොග මිල ලෙය එවකට නියම කර ඇති මිල ඒ උපලේඛනයේ 1 වන තීරුයේ අනුරූප සටහනෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයේ දළ බර හොණ්ඩරයක් ඒ උපලේඛනයේ 2 වන තීරුයේ නිශ්චිතව සඳහන් ප්‍රදේශය හෝ පරිපාලන දිස්ත්‍රික්කය තුළ විකිණිය හැකි හා එයට ඉහළින් නොවිකිණිය යුතු උපරිම තොග මිල විය යුතු ලෙස, වහාම බල පැවැත්වෙන පරිදි නියම කරමි.

(3) මෙහි වූ උපලේඛනයේ 4 වන තීරුයෙහි දක්වෙන මුදල එකතු කරණ ලද (173 වන අධිකාරය වන) මිල පාලන පනත යටතේ කොළඹ මහ නගර සභා ප්‍රදේශය තුළ සිල්ලර වෙළෙන්දෙකු විසින් විකිණිය හැකි උපරිම සිල්ලර මිල ලෙස එවකට නියම කර ඇති මිල, ඒ උපලේඛනයේ 1 වන තීරුයේ අනුරූප සටහනෙහි නිශ්චිතව සඳහන ද්‍රව්‍යයේ ශුද්ධ බර රාත්තලක් ඒ උපලේඛනයේ 1 වන තීරුයේ නිශ්චිතව සඳහන් ප්‍රදේශය හෝ පරිපාලන දිස්ත්‍රික්කය තුළ විකිණිය හැකි හා එයට ඉහළින් නොවිකිණිය යුතු උපරිම සිල්ලර මිල විය යුතු ලෙස, වහාම බල පැවැත්වෙන පරිදි නියම කරමි.

(4) මෙම ආඥාවේ කාර්යය සඳහා—

(අ) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරුයෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයක යම් ප්‍රමාණයක් නැවත විකිණීමේ කාර්ය්‍ය සඳහා වූ යම් විකිණීමක් හෝ ඒ උපලේඛනයේ 1 වන තීරුයෙහි නිශ්චිතව සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බැගින්වූ යම් විකිණීමක් තොග වශයෙන්වූ විකිණීමක් විය යුතු බවත්,

(ආ) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරුයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස දළබර හොණ්ඩරය කට අඩු යම් ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් වූ විකිණීමක් විය යුතු බවත්, නියම කරමි.

(5) මෙම ආඥාවෙන් වැඩිම මිල නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම මෙහි වූ උපලේඛනයේ 1 වන තීරුයේ නිශ්චිතව සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිම තැනැත්තකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(6) මෙම ආඥාවෙන් උපරිම මිල නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම,යම් ස්ථානයක හෝ වාහනයක හෝ මෙහි වූ උපලේඛනයේ 1 වන තීරුයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ සිය පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකු විසින්ම ඒ ද්‍රව්‍යයෙන් ප්‍රමාණවත් කොටසක් සුදුසු භාජනයක බහා එම ද්‍රව්‍යය සඳහා මෙම ආඥාවෙන් නියමිත උපරිම මිල උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම් වලින් මිල සූචකයක හෝ මිල පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට එකී ද්‍රව්‍යය සහ ඒ සඳහා නියම කරණ ලද උපරිම මිළ යම් ගණුදෙනුකරුවකුට පැහැදිළිව පෙනෙන සේ ඒ ස්ථානයෙහි හෝ වාහනයෙහි ප්‍රදර්ශනය කළ යුතු බව නියම කරමි.

(7) මෙම ආඥාවේ කාර්යය සඳහා ''රාත්තල'' හෝ ''රා'' යන්නෙන් ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර සැළකිය යුතු බව නියම කරමි.

(8) මෙම ආඥාවෙන් උපරිම මිල නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම මෙහි වූ උපලේඛනයේ 1 වන තීරුයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තකු හා ඒ උපලේඛනයේ 1 වන තීරුයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින්ම ගැණුම්කරු ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;
(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුව) ;
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් විකිණීම තොග වශයෙන් ද, නැතහොත් සිල්ලර වශයෙන් ද යන බව ඇතුළත් කුවිතාන්සියක් ගැනුම්කරුට දිය යුතු බව නියම කරමි.

(9) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරුයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණූ විට, ඒ විකුණනු ලැබූ ද්‍රව්‍යය යම් දෙයක ඔතනු ලැබේ නම් නැතහොත් බහාලනු ලැබේ නම්, එහි මිලත් ඒ උපලේඛනයේ 3 වන සහ 4 වන තීරුයන්හි සඳහන් උපරිම මිළට ඇතුළත් වියයුතු බව නියම කරමි.

1965 සැප්තැම්බර් මස 22 දින පෙ.ව. 10ට මාතලේ දී අත්සන් කරණ ලදී.

වී. සී. බී. උනන්තැන්න,
මාතලේ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිල පාලක.

### උපලේඛනය

| 1 වන තීරුය | 2 වන තීරුය | 3 වන තීරුය | 4 වන තීරුය |
|---|---|---|---|
| ද්‍රව්‍යය | ප්‍රදේශය හෝ පරිපාලන දිස්ත්‍රික්කය | තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් විකිණිය හැකි කොළඹ මහ නගර සභා ප්‍රදේශය සඳහා නියමිත මිලට වඩා වැඩි අධිකය | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි කොළඹ මහ නගර සභා ප්‍රදේශය සඳහා නියමිත මිලට වඩා වැඩි අධිකය |
| | | රු. ශ. | රු. ශ. |
| එළලු (රතුළුළු සහ වික්බෙලා පූර්) හැර වෙනත් සියළුම වර්ග | 1. කුඹියන්ගොඩ, කොටුවේගෙදර සහ අළුවිහාරේ හැර මාතලේ නගර සභා කොට්ඨාශය | 2 55 ... | 0 2 |
| අර්තාපල් සහ රතුළුළු ... | 2. (අ) මාතලේ නගර සභා කොට්ඨාශය, ඕවිලිකන්ද සහ පරණගන්තැන්න හැර මාතලේ ප්‍රා. ආ. නි. කොට්ඨාශය. (ආ) වැහිගල පොල්වත්තකන්ද, වෙලන්ගහවත්ත සහ අඹන්ගහ කෝරළය හැර රත්තොට ප්‍රා. ආ. නි. කොට්ඨාශය. (ඇ) මාතලේ නගර සභා කොට්ඨාශයට අයත් කුඹියන්ගොඩ, කොටුවේගෙදර සහ අළුවිහාරේ | 2 95 ... | 0 3 |
| | 3. (අ) දඹුල්ල ප්‍රා. ආ. නි. කොට්ඨාශය, (ආ) ගලේවෙල ප්‍රා.ආ. නි. කොට්ඨාශය, (ඇ) රත්තොට ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ අඹන්ගහ කෝරළයේ (කොටස) සහ වැහිගල, පොල්වත්තකන්ද සහ වෙලන්ගහවත්ත, (ඈ) දඹුල්ල ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ අඹන්ගහ කෝරළයේ (කොටස), (ඉ) මාතලේ ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ පරණගන්තැන්න සහ ඕවිලිකන්ද | 3 35 ... | 0 4 |
| | 4. ලග්ගල ප්‍රා. ආ. නි. කොට්ඨාශය ... ... | 3 95 ... | 0 5 |

| 1 වන තීරය | | 2 වන තීරය | 3 වන තීරය | | 4 වන තීරය |
|---|---|---|---|---|---|
| ද්‍රව්‍යය | | ප්‍රදේශය හෝ පරිපාලන දිස්ත්‍රික්කය | තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් විකිණිය හැකි කොළඹ මහ නගර සහා ප්‍රදේශය සඳහා නියමිත මිලට වඩා වැඩි අධිකය | | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි කොළඹ මහ නගර සහා ප්‍රදේශය සඳහා නියමිත මිලට වඩා වැඩි අධිකය |
| | | | රු. ශ. | | රු. ශ. |
| කොත්තමල්ලි, පියලි නොකළ උළුඳු, මුංඇට, තෝර පරිප්පු, කඩල පරිප්පු, සීයඹලා | 1. | කුඹියන්ගොඩ, කොටුවේගෙරද සහ අළුවිහාරේ හැර මාතලේ නගර සහා කොට්ඨාශය | 3 55 | ... | 0 3 |
| එම ... | 2. | (අ) මාතලේ නගර සහා කොට්ඨාශය, ඔවිළිකන්ද සහ පරණ ගන්තැන්න හැර මාතලේ ප්‍රා. ආ. නි. කොට්ඨාශය. (ආ) වැහිගල, පොල්වත්තාකන්ද, වෙලන්ගහවත්ත සහ අඹන් ගහ කෝරළය හැර රත්තොට ප්‍රා. ආ. නි. කොට්ඨාශය, (ඇ) මාතලේ නගර සහා කොට්ඨාශයට අයත් කුඹියන් ගොඩ, කොටුවේගෙදර සහ අළුවිහාරේ | 3 95 | ... | 0 4 |
| එම ... | 3. | (අ) දඹුල්ල ප්‍රා. ආ. නි. කොට්ඨාශය, (ආ) ගලේවෙල ප්‍රා. ආ. නි. කොට්ඨාශය, (ඇ) රත්තොට ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ අඹන්ගහ කෝරළයේ (කොටස) සහ වැහිගල, පොල්වත් තාකන්ද සහ වෙලන්ගහවත්ත, (ඈ) දඹුල්ල ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ අඹන්ගහ කෝරළයේ කොටස), (ඉ) මාතලේ ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ පරණගන්තැන්න සහ ඔවිළිකන්ද | 4 35 | ... | 0 5 |
| එම ... | 4. | ලග්ගල ප්‍රා. ආ. නි. කොට්ඨාශය ... ... | 4 95 | ... | 0 6 |

සැළකිය යුතුයි.—මේ මිළ ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු ලෙස නියම කර ඇති මිල නොවේ. ඒවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි උපරිම මිල වන අතර ඊට ඉහළින් ඒ ද්‍රව්‍ය නොවිකිණිය යුතුය.

9—1149

---

**අංක මොන/දි/21/1965 දරණ ආහාර මිල ආඥාව** **අතිරේක ආහාර ද්‍රව්‍ය**

## මිල පාලන පනත

### ආඥාව

(173 වන අධිකාරය වන) මිල පාලන පනතේ 3 (2) වන වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මොණරාගල දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිල පාලක තැන්පත් මහතන්තිරිගේ විමලානන්ද අමරසේකර වන මම, මේ ආඥාවෙන් —

(i) 1964.12.4 වන දින අංක 14,248 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ 1964.11.26 වන දින අංක මොන/දි/20/1964 දරණ ආහාර මිල ආඥාව වහාම බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි.

(ii) මෙහි වූ උපලේඛනයේ 3 වන තීරයෙහි දක්වෙන මුදල එකතු කරන ලද, (173 වන අධිකාරය වන) මිල පාලන පනත යටතේ කොළඹ මහ නගර සහා ප්‍රදේශය තුළ තොග වෙළෙන්දෙකු විසින් විකිණිය හැකි උපරිම තොග මිල ලෙස එවකට නියම කර ඇති මිල ඒ උපලේඛනයේ 1 වන තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිත ව සඳහන් ද්‍රව්‍යයේ දළ බර හොණ්ඩරයක් 2 වන උපලේඛනය සමග කියවිය යුතු 1 වන උපලේඛනයේ 2 වන තීරයෙහි නිශ්චිත සඳහන් ප්‍රදේශය තුළ විකිණිය හැකි හා එයට ඉහළින් නො විකිණිය යුතු උපරිම තොග මිල විය යුතු ලෙස, වහාම බලපැවැත්වෙන පරිදි නියම කරමි.

(iii) මෙහි වූ උපලේඛනයේ 4 වන තීරයෙහි දක්වෙන මුදල එකතු කරන ලද, (173 වන අධිකාරය වන) මිල පාලන පනත යටතේ කොළඹ මහ නගර සහා ප්‍රදේශය තුළ සිල්ලර වෙළෙන්දකු විසින් විකිණිය හැකි උපරිම සිල්ලර මිල ලෙස එවකට නියම කර ඇති මිල, ඒ උපලේඛනයේ 1 වන තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයේ ශුද්ධ බර රාත්තලක් 2 වන උපලේඛනය සමග කියවිය යුතු 1 වන උපලේඛනයේ 2 වන තීරයෙහි නිශ්චිතව සඳහන් ප්‍රදේශය තුළ විකිණිය හැකි හා එයට ඉහළින් නො විකිණිය යුතු උපරිම සිල්ලර මිල විය යුතු ලෙස, වහාම බල පැවැත්වෙන පරිදි නියම කරමි.

(iv) මෙම ආඥාවේ කාර්‍ය්‍ය සඳහා—

(අ) මෙහිවූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයක යම් ප්‍රමාණයක් නැවත විකිණීමේ කාර්‍ය සඳහා වූ යම් විකිණීමක් හෝ ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බැගින්වූ යම් විකිණීමක් තොග වශයෙන් වූ විකිණීමක් විය යුතු බවත්,

(ආ) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස දළබර හොණ්ඩරයකට අඩු යම් ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන්වූ විකිණීමක් විය යුතු බවත්, නියම කරමි.

(v) මෙම ආඥාවෙන් වැඩිම මිල නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම මෙහිවූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිම තැනැත්තකු විසින් නො විකිණියයුතු බව නියම කරමි.

(vi) මෙම ආඥාවෙන් උපරිම මිල නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ වාහනයක හෝ මෙහිවූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ සිය පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දකු විසින්ම ඒ ද්‍රව්‍යයෙන් ප්‍රමාණවත් කොටසක් සුදුසු භාජනයක බහා එම් ද්‍රව්‍ය සඳහා මෙම ආඥාවෙන් නියමිත උපරිම මිල උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම් වලින් මිල සූචකයක හෝ මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට එකී ද්‍රව්‍යය සහ ඒ සඳහා නියම කරන ලද උපරිම මිල යම් ගනුදෙනු කරුවකුට පැහැදිළිව පෙනෙන සේ ඒ ස්ථානයෙහි හෝ වාහනයෙහි ප්‍රදර්ශනය කළයුතු බව නියම කරමි.

(vii) මෙම ආඥාවේ කාර්‍ය්‍ය සඳහා " රාත්තල " හෝ " රා " යන්නෙන් ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර සැලකිය යුතු බව නියම කරමි.

(viii) මෙම ආඥාවෙන් උපරිම මිල නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම මෙහිවූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තකු හා ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම ගැණුම්කරු ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය;

(ආ) එම ද්‍රව්‍යයන් විකුණූ ප්‍රමාණය (බර අනුව);

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් විකිණීම තොග වශයෙන්ද, නැතහොත් සිල්ලර වශයෙන් ද යන බව ඇතුලත් කුවිතාන්සියක් ගැණුම්කරුට දිය යුතු බව නියම කරමි.

(ix) මෙහිවූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණූ විට, ඒ විකුණනු ලැබූ ද්‍රව්‍යය යම් දෙයක ඔතනු ලැබේ නම් නැතහොත් බහාලනු ලැබේ නම්, එහි මිලත් ඒ උපලේඛනයේ 3 වන සහ 4 වන තීරයන්හි සඳහන් උපරිම මිළට ඇතුළත් විය යුතු බව නියම කරමි.

එම්. ටී. ඩබ්ලිව්. අමරසේකර,
මොණරාගල දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිල පාලක.

1965 ක්වූ සැප්තැම්බර් මස 15 වැනි දින පෙ. ව. 10 ට, මොණරාගල කච්චේරියේදී අත්සන් කරන ලදී.

## උපලේඛනය 1

| 1 වන තීරය | 2 වන තීරය | 3 වන තීරය | 4 වන තීරය |
|---|---|---|---|
| ද්‍රව්‍යය | ප්‍රදේශය | තොග වෙළෙන්දකු විසින් දළ බර හොණ්ඩරයක් විකිණිය හැකි කොළඹ මහ නගර සහා ප්‍රදේශය සඳහා නියමිත මිලට වඩා වැඩි අධිකය රු. ශ. | සිල්ලර වෙළෙන්දකු විසින් ශුද්ධබර රාත්තලක් විකිණිය හැකි කොළඹ මහ නගර සහා ප්‍රදේශය සඳහා නියමිත මිලට වඩා වැඩි අධිකය ශත. |
| ළූනු (රතුළූනු සහ වික්බෙලපූර් හැර වෙනත් සියළුම) | ප්‍රදේශ අංක 1 | 2 40 | 03 |
| එම | ප්‍රදේශ අංක 2 | 2 50 | 04 |
| එම | ප්‍රදේශ අංක 3 | 2 70 | 05 |
| කොත්තමල්ලි | ප්‍රදේශ අංක 1 | 3 40 | 04 |
| එම | ප්‍රදේශ අංක 2 | 3 50 | 05 |
| එම | ප්‍රදේශ අංක 3 | 3 70 | 06 |
| පියලි නොකළ උලුදු | ප්‍රදේශ අංක 1 | 3 40 | 04 |
| එම | ප්‍රදේශ අංක 2 | 3 50 | 05 |
| එම | ප්‍රදේශ අංක 3 | 3 70 | 06 |
| මුංඇට | ප්‍රදේශ අංක 1 | 3 40 | 04 |
| එම | ප්‍රදේශ අංක 2 | 3 50 | 05 |
| එම | ප්‍රදේශ අංක 3 | 3 70 | 06 |
| තෝර පරිප්පු | ප්‍රදේශ අංක 1 | 3 40 | 04 |
| එම | ප්‍රදේශ අංක 2 | 3 50 | 05 |
| එම | ප්‍රදේශ අංක 3 | 3 70 | 06 |
| කඩල පරිප්පු | ප්‍රදේශ අංක 1 | 3 40 | 04 |
| එම | ප්‍රදේශ අංක 2 | 3 50 | 05 |
| එම | ප්‍රදේශ අංක 3 | 3 70 | 06 |
| සියඹලා | ප්‍රදේශ අංක 1 | 3 40 | 04 |
| එම | ප්‍රදේශ අංක 2 | 3 50 | 05 |
| එම | ප්‍රදේශ අංක 3 | 3 70 | 06 |
| අර්තාපල් | ප්‍රදේශ අංක 1 | 2 40 | 03 |
| එම | ප්‍රදේශ අංක 2 | 2 50 | 04 |
| එම | ප්‍රදේශ අංක 3 | 2 70 | 05 |
| රතුළූනු | ප්‍රදේශ අංක 1 | 3 40 | 04 |
| එම | ප්‍රදේශ අංක 2 | 3 50 | 05 |
| එම | ප්‍රදේශ අංක 3 | 3 70 | 06 |
| සක්කර | ප්‍රදේශ අංක 1 | 3 40 | 04 |
| එම | ප්‍රදේශ අංක 2 | 3 50 | 05 |
| එම | ප්‍රදේශ අංක 3 | 3 70 | 06 |

**සැළකිය යුතුය.**—මේ මිල ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු ලෙස නියමකර ඇති මිල නොවේ. ඒවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි උපරිම මිල වන අතර ඊට ඉහලින් ඒ ද්‍රව්‍ය නොවිකිණිය යුතුය.

## උපලේඛනය 2

**ප්‍රදේශ අංක 1.**—වැල්ලවාය නගර සීමාව, බුත්තල නගර සීමාව, බිබිල නගර සීමාව, මොණරාගල නගර සභා සීමාව, බඩල්කුඹුර කඩමණ්ඩිය.

**ප්‍රදේශ අංක 2.**—වැල්ලවාය නගරය හැර වැල්ලවාය ගම්සභා සීමාව, බිබිල නගරය හැර වෑගම්පත්තු නිල්ගල ගම්සභා සීමාව, බුත්තල නගරය හැර බුත්තල ගම්සභා සීමාව, බඩල්කුඹුර කඩමණ්ඩිය හැර කඳුකර ගම්සභා සීමාව.

**ප්‍රදේශ අංක 3.**—දඹගල්ල ගම්සභා සීමාව, සිත්තරම් පළාත, මොණරාගල නගරය හැර බුත්තල වැදිරට ගම්සභා සීමාව, මොණරාගල දිස්ත්‍රික්කයට අයත්වන බින්තැන්න පත්තුවේ කොටස.

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## අංක 19/65 දරණ ආනයන පාලන දැන්වීම

### නිෂ්පාදන කර්මාන්ත—සැබෑ පරිහරණ බලපත්‍ර

1965 වර්ෂයේ දී නිකුත් කරණ ලද සියළුම සැබෑ පරිහරණ බලපත්‍රවල වලංගු දිනය නැවිගත කිරීම සඳහා 1965 දෙසැම්බර් මස 31 වැනි දින තෙක් මෙයින් දීර්ඝ කරනු ලැබේ.

ටී. එම්. විජේනායක,
ආනයන හා අපනයන පාලක.

1965 සැප්තැම්බර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

9–1151

---

## රේගු නිවේදනය අංක 61/9/200

ආදයම් රක්ෂණ ආඥපනත (250 වෙනි අධිකාරය) යටතේ අංක 12.781 හා 1961 නොවැම්බර් මස 24 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1962 මාර්තු 14 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද ආඥව අනුව, 1965 සැප්තැම්බර් මස 27 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා නොම්මර එකේ ආර්. එ්ස්. එස්. රබර් රාත්තලක තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම හා ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරු ගාස්තු පහත දක්වේ.

මේ තීරු ගාස්තුව රේගු ආඥපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි :—

| රබර් | රු. ශ. |
|---|---|
| නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම—රාත්තලකට ... ... ... | 1 04 |
| ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව —රාත්තලකට ... ... ... ... ... | 0 06 |

අංක ඊ. 781.
1965 සැප්තැම්බර් මස 25 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

ග. කුමාරණතුංග.
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

9-1152

---

## රේගු දැන්වීම අංක 64/5/60

1964 අගෝස්තු මස 8 වෙනි දින අංක 14,138 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1964.10.16 වැනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරගත්, 1962 අංක 19 දරණ ආදයම් සංරක්ෂණ පනතේ 2 වන ඡේදය යටතේ පැනෙන ආඥව ක්‍රියාත්මක කිරීම සඳහා, 1965 සැප්තැම්බර් මස 27 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා ලන්ඩන් වෙළඳ පොළෙහි පිලිප්පයින් කොප්පරාවල තක්සේරු කරනු ලැබූ රක්ෂණ හා වාහන ගාස්තු ඇතුළත් වටිනාකම ටොන් එකක් අමෙරිකානු ඩොලර් 207⅝ වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. කොප්පරා, පොල්තෙල්, කපාපු පොල් හා ගෙඩි පොල් සඳහා ගෙවිය යුතු අපනයන තීරු ගාස්තු මෙහි පහත පෙනෙන පරිදි වේ :—

| කොප්පරා ටොන් එකක් සඳහා අපනයන තීරුව | පොල්තෙල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | කපාපු පොල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | අමු පොල් ගෙඩි 1,000ක් සඳහා අපනයන තීරුව |
|---|---|---|---|
| රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 268 85 ... | 250 0 ... | 212 31 ... | 67 21 |

3. මෙම තීරු ගාස්තු රේගු ආඥපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි.

අංක ඊ. 744/22.
1965 සැප්තැම්බර් මස 25 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

ග. කුමාරණතුංග.
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

9–1153

ලංකාවේ මාලම්බේකාසෙහි පිහිටි " ඩිස් ට්‍රික්ට් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසියෙහි
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි